THE OPEN UNIVERSITY OF SRI LANKA
LIBRARY

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපනපති උපාධි පාඨමාලාව

අවසාන පරීක්ෂණය - 2013

**ESP 2318 -** අධ්‍යාපන කළමනාකරණය

කාලය - පැය තුනයි.

---

දිනය - 2013 මැයි 05 වන දින        වේලාව - පෙ.ව.09.30 - ප.ව. 12.30

---

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.

01. i. කළමනාකරණ කාර්යයන් ඔබගේ සංවිධානයට අදාල වන අයුරින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

ii. 'කළමනාකරණ භූමිකාවන් කළමනාකරණ කාර්යයන්ට වඩා පුළුල් වේ.' මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

iii. ඔබගේ සංවිධානය තුළ පවතින අර්බුදකාරී කළමනාකරණ ගැටළුවක් තෝරාගෙන එය විසඳීමට සුදුසු ව්‍යාපෘති යෝජනාවක් සකසන්න. (ලකුණු 15)

02. i. 'නායකයා' සහ 'කළමනාකරු' අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 08)

ii. ඕනෑම නායකත්ව න්‍යායයක් තෝරාගෙන එය ඔබගේ ආයතනයේ නායකත්ව භූමිකාව සමඟ විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු 10)

iii. ඔබගේ ආයතනයේ කාර්යක්ෂමතාව හා ඵලදායිතාව ඉහළ නැංවීමට කුමන නායකත්ව ශෛලයයක් ඔබ නිර්දේශ කරන්නේදැයි උදාහරණ උපුටා දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

03. i. ඔබගේ ආයතනයේ හෝ ඔබ හොඳින් දන්නා වෙනත් ආයතනයක මෑතකදී හඳුන්වා දුන් වෙනසක් දක්වා එම වෙනසට බලපෑ සාධක මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 08)

ii. ඇතැම් පුද්ගලයන් වෙනස්වීමට අකමැති වන්නේ කුමන හේතූන් මතදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

iii. වෙනස්වීම් ආකෘතියක් කෙටියෙන් පැහැදිලි කොට එහි වාසි අවාසි සාකච්ඡා කරන්න. (ලකුණු 15)

පහත සඳහන් ඕනෑම තුනකට කෙටි සටහන් ලියන්න.

i. ආයතනික මට්ටමේ සැලසුම්කරණය
ii. සාර්ථක වෙනස්වීම් කාරකයකුගේ ගති ලක්‍ෂණ
iii. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කළමනාකරණය සහ පුහුණුව
iv. පාසල්වල අභ්‍යන්තර සන්නිවේදනය
v. කළමනාකරණයේ චර්යාත්මක ප්‍රවේශය සහ විද්‍යාත්මක ප්‍රවේශය (ලකුණු 11 x 3= 33)

i. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පරිපාලනයේ ඉතිහාසය යනු අධ්‍යාපන පරිපාලනයේ විමධ්‍යගත කරණයයි. (ලකුණු 08)

ii. ශ්‍රී ලංකාවේ වර්තමාන අධ්‍යාපන ව්‍යුහය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

iii. 2003 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ ජාතික අධ්‍යාපන කොමිසම විසින් නිර්දේශිත අධ්‍යාපන කළමනාකරණ ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු 15)

i. ගැටුම් යන සංකල්පය උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

ii. සංවිධානයක ගැටුම් ඇති වීමට බලපෑ හැකි හේතු මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

iii. ගැටුම් කළමනාකරණ ආකෘතියක් තෝරාගෙන එහි වාසි හා අවාසි විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු 15)

හිමිකම් ඇවිරිණි.